41 වන පිටෙන්

වන්නේ අපි පරිගනකයට දෙන දත්ත අනුවය. එලෙසින්ම අපි ප්‍රතිචාර දක්වන්නේ ඇස, කණ, නාසය ආදී ආයතනයන්ගෙන් ලැබෙන සංඥා අනුවය. රූප, ශබ්ද, ගන්ධ ආදී බාහිර ලෝකයේ එකම අරමුණු ඇස, කණ, නාසය ආදීයේ ගැටීමෙන් අභ්‍යන්තර ආයතන තුළ සමාන සකස්වීම් ක්‍රියාවලියක් සිදුවෙද්දී පිටතට එන සංඥා යථා රූපී නොවීම ''සංඥා විපල්‍යාසය'' යැයි බුදු හාමුදුරුවෝ දේශනා කොට තිබේ. කැල්කි යුලේටරයක 'වයර් මාරුව' ලෙසින් පෙර හැඳින්වූයේ ද මෙයමය.

අනවබෝධය හෙවත් නොදැනීම නිසා අසත්පුරුෂයා සත්පුරුෂයෙකු ලෙස හැඳින ගැනීමෙන් සිත තුළ සතුටක් ඇතිවිය. ඒ සතුට හේතුවී දෙවනුව ඒ කෙරෙහි ඇලීමක් ඇතිවිය. ඒ ඇලීම හේතුවී තෙවනුව අරමුණ සිතෙන් තදින් අල්ලා ගැනීමක් ඇතිවිය. අරමුණ පිළිබඳ බැඳීමක් ඇතිවිය. උපාදාන විය හැකි ස්ඛන්ධ පිළිබඳ සැබෑව නොදැනීම හේතු වී දුක් වේදනා හටගත යුතු තැන සැප වේදනා හටගන්නේ එලෙසිනි. එබැවින් අපි පස්කම් සැපයෙන් යම් සැප වේදනාවක් විඳින්නේද, ඒ සැප වේදනාව අපට සිදුව ඇති වැරදීමකි. ඒ වැරදීම හේතුවෙන් දැනෙන දේ වුවත් අපට දැනෙන දේ බැවින් අපි එය ඒ ආකාරයෙන්ම විශ්වාස කරමු. යම් කිසි ආකාරයකින් මේ වැරදීම නිවැරදි කළේ නම් එතැන අපට ඇතිවන්නේ දුක් වේදනාවකි. එසේ නම් අපට දුක් වේදනාව සැප වේදනාවක් සේ දැනීමට හේතුව පස්කම් සැපය පිළිබඳ අප තුළ බැස ඇති වැරදි දෘෂ්ටියක් බව දැන් පැහැදිලිද?.

අපි ''සැපක්'' සේ දකින පස්කම් සැපය බුදු රජාණන්වහන්සේ විස්තර කළේ අසුචි සැපයක් ලෙසටය. උදෑසනක පාරේ ගමන් කරන විට අසුචි ගොඩක් අප නෙත ගැටුණ හොත් ඇතිවන සංඥාව කවරාකාරද? අප්‍රසන්න, අසුබ, අනර්ථ, පිළිකුල් සංඥාවකි. එහෙත් මේ අවස්ථාවේදී අප සමඟම ගමන් කරමින් සිටි ඌරෙකුට, ඊරියකට හෝ ඌරු පැටියෙකුට මේ දසුනින් ඇතිවන සංඥාව කුමක්ද? ම්ම්ම්.... ෂාාාහ් වැනි මහත් ආශ්වාදනීය එකක් නොවේද ? එම ආශ්වාදනීය සංඥාවෙන් අසුචි ගොඩ කරා දිව යන ඌරා හෝ ඊරි හෝ ඌරු පැටියා හෝ පිළිබඳ අපට ඇතිවන හැඟීම කුමක්ද? අන්න ඒ හැඟීමට සමාන්තර හැඟීමක් පංච උපාදාන ස්ඛන්ධය මත්තේ නහින්නට හදන අප ගැන රහතන්වහන්සේලාට ඇතිවන්නේය.

අප මේ දක්වා සාකච්ඡා කළ සියල්ල නිසි ලෙස අවබෝධ කරගත්තේ නම් පංච උපාදාන ස්ඛන්ධය පිළිබඳ වැරදි දෘෂ්ටියක් ඔබ තුළ තිබෙන බව ඔබට දැන් තේරුම් යා යුතුය. පංච උපාදාන ස්ඛන්ධයටම 'සක්කාය' යැයි ද කියති. පංච උපාදාන ස්ඛන්ධය වරදවා ගැනීමට 'සක්කාය දිට්ඨිය' යැයි කියති. ධර්මාවබෝධයට බලාපොරොත්තු වන අය පළමුව කළ යුත්තේ සක්කාය දිට්ඨිය දුරු කර ගැනීමය. අපගේ පළමු අරමුණ විය යුත්තේ එයයි.

එය සිදුකරගන්නේ කෙසේද ? පංච උපාදාන ස්ඛන්ධය පිළිබඳ නිවැරදි සිහිය උපදවා ගැනීමෙනි. ධර්ම දේශනාවකට සවන් දීමෙන් පසුව එක්තරා ප්‍රමාණයකට මේ නිවැරදි සිහිය ඇති වෙතත් එය ඒ ආකාරයෙන් දිගටම පවතින්නේ නැත. ධර්ම දේශනාවකින් සිදුවන්නේ පංච උපාදාන ස්ඛන්ධය සම්බන්ධයෙන් සිදුව ඇති වරද ගැන නුවණක් ලැබීමය. ඒ නුවණ හේතුවෙන් නිවැරදි සිහියක් ඇතිවේ. ඒ සිහිය දිගින් දිගටම පවත්වා ගැනීමට හැකි නම් සක්කාය දිට්ඨිය දුරුකරගත හැකිය. ධර්මය පිළිබඳ හැදෑරීමෙන් ඒ පිළිබඳ නුවණක් උපදියි. එහෙත් එය සිහියක් ලෙස පවත්වා ගැනීමට නම් ධර්මය පංච උපාදාන ස්ඛන්ධයට ගලපා ගැනීමේ හැකියාව තිබිය යුතුය. ගැලපූ ගමන් සිහිය ඇතිවේ. එහෙත් ලෝභ, ද්වේෂ, මෝහ යන අකුසල් සිතේ බලවත් නැඟීම හේතුවෙන් ඇත්ත වැහෙන ස්වාභාවයකට අපි සැමදාම ගොදුරු වන්නෙමු. මේ 'සංඥා විපල්‍යාසය' (වයර් මාරුව) නැති කොට ගෙන සෑම කල්හිම කටයුතු කිරීම සඳහා දැනීම සහ අවබෝධය තුළින් ඇති කරගන්නා නිවැරදි දෘෂ්ටියක් අවශ්‍යය. එය නිරන්තරයෙන් ක්‍රියාත්මකව පැවතීම අවශ්‍යය ය. එසේ පවත්වා ගැනීමට සිහිය පිහිටුවා ගැනීම යැයි කියයි. ධර්ම ශ්‍රවණය කරන අවස්ථාවල පිහිටන සිහිය බොහෝ විට නැවත එදිනෙදා වැඩකටයුතුවල නිරතවන විට නොපිහිටීම අප මුහුණ දෙන ගැටළුවකි. එසේ නොවී සෑම විටම සිහිය පිහිටුවාගෙන කටයුතු කරන්නට හැකි නම් අප සංඥා විපල්‍යාසයට ගොදුරු නොවන්නේය. එසේ නිරන්තරයෙන් සිහිය පිහිටුවා ගෙන විසීමේ වැඩ පිළිවෙළක් බුදු රජාණන්වහන්සේ දේශනා කොට තිබේ. ඒ, සතර සති පට්ඨානයයි. කයේ, වේදනාවේ, සිතේ සහ ධර්මයේ සිහිය පිහිටුවාගෙන ජීවත්වන ආකාරය එහි ඉගැන්වේ. අපි සතර සති පට්ඨානය වැඩිය යුත්තේ ඒ නිසාය. එවිට ප්‍රඥාව ඇතිවේ. අවසානයේ නිවන හෙවත් සදාකාලික සැපය ළඟා කොට ගත හැකිවේ.

ඒ සඳහා වන ගමන අපි ආරම්භ කළ යුත්තේ ශීලයෙනි. ශීලයෙන් සමාධියටත්, සාමාධියෙන් ප්‍රඥාවටත් එය විහිදේ. මේ ගමන යන මාවත 'ආර්ය අෂ්ඨාංගික මාර්ගය' යනුවෙන් බුදු හාමුදුරුවෝ දේශනා කොට තිබේ. දුක නසනු කැමැති යම් කෙනෙකු වේද, ඒ සඳහා වන එකම මග එයම වේ. බුදු දහමේ හැර අන් කිසිදු දහමක හෝ ආගමක මේ මාර්ගය දක්වා නොමැත. බුදු දහමේ ඇති විශේෂත්වය එයයි. බුදු දහම දුක පිළිබඳවම කතා කරන දහමක් ලෙස ඇතැම් අය වරදවා වටහා ගෙන ඇත. බුදු දහම දුක ගැන කතා කරන බව සැබෑය. ඒ අවස්ථා හතරක් යටතේය. දුක ගැන කතා කොට දුක ඇතිවන ආකාරයද, දුක නැති කිරීමද, දුක නැති කරගන්නා මාර්ගය පිළිබඳවද බුදු දහම කතා කරති. අවසානය දුක නැති කොට ගැනීමය. දුක නැති කොට ගැනීම යනු සැපතට පත්වීමකි. බුදු දහම දුක පිළිබඳ කතා කොට ඇත්තේ සැපතට පත්වීමේ මාර්ගය පෙන්වා දීම සඳහාය. එයද අපි බහුලව සැප යැයි හඳුනාගෙන සිටින තාවකාලික සැපයක් නොව සදාකාලික, නොවෙනස් සැපයකි. නිර්වාන සැපයයි.

-ශ්‍රීලාල් සෙනෙවිරත්න

# Vision for present-day immigration



Migration is not new. It has happened from times immemorial. In fact, it is Homo sapiens or the modern human beings, who evolved in Africa about 200,000 years ago, as a result of an alarming climate change. Like their contemporaries, Neanderthals and Denisovana, they were food gatherers, hunters, and evolved behavioural patterns to respond to the challenges to their survival in unsuitable environments.

Pre-historic Homo sapiens not only used stone tools but they specialized in making tools such as bows and arrows, spear throwers, fishhooks and harpoons, and even sewing needles. With the extinction of animal life, they made a dramatic transition to food growing and bringing about a change in surroundings and leading to a settled life. Villages became towns, towns became cities, population expanded, boundaries and borders were broken, and




the spread of people to neighbouring countries began on a mass scale to take out the pressures of life; witnessing an amazing turning point in the history of life on the planet.

Homo sapiens from Southeast Asia travelled to Australia about 60,000 years ago. They came by boats or rafts as Australia was not connected to Southeast Asia by land. They were the first Australian Aborigines. Some reached the Japanese Islands about 30,000 years ago, and some migrated to into North-eastern Siberia and then to North America via the Bering Plain, about 20,000 years back. The intercontinental land between Siberia and Alaska was a result of sea levels dropping up to 450 feet during the final cold period of the last ice age, demarcating the Old and the New World human evolution.

The significant consequence of human migration into new regions was the extinction of animal species indigenous to those areas, causing an imbalance in the ecosystem between animals and their prey. People, however, switched on to smaller animals and plants for their survival. Migration also caused denser and larger populations and spread of highly contagious diseases such as tuberculosis, small pox, influenza among the communities and wiped out a higher percentage of the people. That was the reason why people chose countries with better and healthier climate conditions, advanced technology and medical sciences, opportunities for learning and employment when they sought migration. What direction human evolution will take in the future cannot be determined, but it is certain that we will continue to evolve until we reach the point of extinction.

The process of present-day migration is no different to the objectives and aspirations of our forefathers, and we should not look at this burning issue now in our midst with a squint or crossed-eye.

According to the United Nations, the number of international migrants – persons living in a country other than where they were born – reached 244 million in 2015, a 41 per cent increase compared to 2000. This figure includes 20 million refugees.

It is sad to learn that only a small percentage of the world's most vulnerable refugees such as survivors of torture, unaccompanied female refugees at risk of sexual abuse in refugee camps, and lesbian, gay, bisexual and transsexual refugees who are at risk of persecution even after leaving their countries, are considered eligible for resettlement in 2017. The UN High Commission for Refugees (UNHCR) expects to resettle only about 170,000 out of 1.19 million refugees.

Migration has now become a complex and difficult problem to solve easily as some unscrupulous persons are trafficking people to affluent countries for business gains. Most of them are women and young girls who are either pushed to work as house-maids or prostitutes.

There is also another category of economic migrants who undertake perilous journeys in boats to enter other countries for greener pastures.

It is imperative that the UN undertake a survey of these countries and evolve a program to reduce or eliminate these illegal migrations as well.